// ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශේෂ

අංක 1914/5 - 2015 මැයි මස 11 වැනි සඳුදා - 2015.05.11

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡේදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්.ඩී.බී 14/2014.

**පඩිපාලක සභා ආඥාපනත**

(136 වැනි අධිකාරය වූ) පඩිපාලක සභා ආඥාපනතේ 63 වන වගන්තිය යටතේ කම්කරු අමාත්‍යවරයා විසින් සාදනු ලබන පාර්ලිමේන්තුව විසින් අනුමත කරන ලද නියෝගය.

එස්. බී. නාවින්න,
කම්කරු අමාත්‍ය.

2015 මැයි මස 06 වැනි දින,
කොළඹ දී ය.

නියෝගය

2005 මාර්තු මස 4 වන දින අංක 1382/23 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළකරන ලද නියෝගය මගින් අවසන්වරට සංශෝධිත සහ 1971 ජුනි මස 4 වන දින අංක 14961 දරන ලංකා ගැසට් පත්‍රයේ පළකරන ලද 1971 පඩි පාලක සභා නියෝගවල 31 වන නියෝගය පහත දැක්වෙන පරිදි මෙයින් තවදුරටත් සංශෝධනය කරනු ලැබේ.

1. ඒ නියෝගයේ (අ) අනුඡේදයේ "රුපියල් හාරසියයක්" යන වචන වෙනුවට "රුපියල් එක්දහස් පන්සියයක්" යන වචන ආදේශ කිරීමෙන් ; සහ

2. ඒ නියෝගයේ (ආ) අනුඡේදයේ "රුපියල් පන්සියයක්" යන වචන වෙනුවට "රුපියල් දෙදහසක්" යන වචන ආදේශ කිරීමෙන්.

05 - 657